## ''අපේක්ෂා ආලෝක ධාරාව'' (Ray of Hope) සංගීත උළෙලෙහි දී

ශ්‍රී ලංකාවෙහි චීන තානාපති අතිගරු චෙං ක්ෂෙයුආන් මැතිතුමන් විසින් පැවැත්වෙන දේශනය

( 2019 ඔක්තෝබර් 26 වැනිදා කොළඹ ෂැංග්‍රි ලා හෝටලයේ දී )

ආයුබෝවන්, ශුභ සන්ධ්‍යාවක් !

ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිඳුනි,
ගරු කථානායක කරු ජයසූරිය මැතිඳුනි,
අතිගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිඳුනි,

ගරු නීතිපති දප්පුල ද ලිවේරා මැතිඳුනි,

මහත්ම මහත්මීනි,

අද රාත්‍රියෙහි දී පැවැත්වෙන ''Ray of Hope'' නැතහොත් ''අපේක්ෂා ආලෝක ධාරාව'' උළෙල පිළිබඳව පැති තුනක් ඔස්සේ මා තුළ පහළ වන අදහස් ඔබ හමුවෙහි තැබීමට මා කැමැතියි.

**ඉන් පළමුවැන්න නම් අධිකරණය සහ නීතියේ ආධිපත්‍යය රටක ''අපේක්ෂා ආලෝක ධාරාව '' වන බවයි.**

ශ්‍රී ලංකාවෙහි නීතිපති දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව පැවැත්වෙන මෙම 135 වැනි සංවත්සරයේ දී චීන රජය වෙනුවෙන් මම උණුසුම් සුබ පැතුම් ඔබ වෙත පිරිනමනවා.

අධිකරණයෙහි ස්වාධීනත්වය සහ රටවැසියන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් පසුගිය අවුරුදු 135 පුරා ම මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කර තිබෙනවා. ශ්‍රී ලංකාවෙහි සංවර්ධනය සඳහා නීතියේ ආධිපත්‍යය පැත්තෙන් යොදන ලද එම පදනම සමස්ත රටෙහි ම ගෞරවයටත් අගැයීමටත් පාත්‍ර වෙනවා. දේශපාලනය, ආර්ථිකය සහ සමාජය යන අංශයන් හි සිදු වන ශීඝ්‍ර සංවර්ධනය හමුවෙහි ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින නව අවස්ථාවන් සහ අභියෝගයන් සම්බන්ධයෙන් විශාල වැඩ කොටසක් ඉටු කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවට හැකි වේවා'යි මා ප්‍රාර්ථනා කරනවා.

අප දෙරටෙහි එකිනෙකට වෙනස් නෛතික නීති පද්ධතීන් අතර පවතින පරතරයන් හේතු කොටගෙන මතු වන දුෂ්කරතාවන් අබිබවා යමින් එකී නෛතික සංස්කෘතීන් එකට යා කරන පාලමක් බවට පත් වීමටත් Belt and Road සහයෝගිතා වැඩ පිළිවෙළ සඳහා ඉවහල් වන නෛතික වටපිටාවක් නිර්මාණය කිරීමටත් නීතිපති දෙපාර්තමේන්තුවට හැකි වී තිබෙන බව අවධාරණයෙන් ප්‍රකාශ කරන අතර ම ඒ වෙනුවෙන් දරන ලද ප්‍රයත්නයන් ද මා බෙහෙවින් ම අගය කරනවා.

**දෙවැනි කාරණය වන්නේ මිත්‍රත්වය සහ සහයෝගිතාව යනු චීන ශ්‍රී ලංකා සම්බන්ධතා සඳහා වූ ''අපේක්ෂා ආලෝක ධාරාව'' වන බවයි.**

චීනය සහ ශ්‍රී ලංකාව කියන්නේ හොඳ අසල්වැසියන්. හොඳ මිත්‍රයන්. හොඳ හවුල්කරුවන්. ඉතිහාසයේ අවුරුදු දහස් ගණනකටත් වැඩි කාලයක් අප අතර මිත්‍රශීලී ගනුදෙනු සිදු වී තිබෙනවා. ඓතිහාසික සහල් = රබර් ගිවිසුමත් ෂෞ එන්ලායි සහ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වැනි අප දෙරටෙහි විශිෂ්ට ජනනායකයන් අතර පැවැති සමීප මිත්‍රත්වයත් මෙහි දී සිහිපත් කළ යුතුයි.

දැන්, චීන = ශ්‍රී ලංකා Belt and Road සහයෝගිතාව විසින් අප ගේ ද්විපාර්ශ්වික සම්බන්ධතාවන් අලුත් මට්ටමක් දක්වා ගෙනැවිත් තිබෙන අතර ශ්‍රී ලංකාවෙහි ආර්ථික සහ සමාජ මුහුණුවර ද ඒ අනුව ඉහළ මට්ටමකට පත් කරනු ලැබ තිබෙනවා. මෙම කලාපයේ ඉහළ ම විදේශ ආයෝජනයනුත් සංචාරකයනුත් ඉංජිනේරු කොන්ත්‍රාත්කරුවනුත් විදේශීය ආධාරත් සපයනු ලබන්නේ චීනයෙන් බව කිව යුතුයි.

නොරොච්චෝලේ විදුලි බලාගාරයෙන් සහ කටුනායක ගුවන් තොටුපොළෙන් පටන් ගෙන දක්ෂිණ දුම්රිය මාර්ගය දක්වාත් කොළඹ ජාත්‍යන්තර බහලුම් අංගනයේ සහ කොළඹ වරාය නගරයේ සිට හම්බන්තොට වරාය දක්වාත් වූ සියලු ම යෝධ ව්‍යාපෘතීන් තුළින් පැහැදිලි වන්නේ අප දෙරට මෙන් ම දෙරටෙහි ජනතාව වෙත ද මනා ප්‍රතිලාභ ගෙන ඒම පිණිස දරනු ලබන ඒකාබද්ධ ප්‍රයත්නයන් හි සහ අප ගේ පොදු අරමුණුවල ස්වභාවයයි.

අප දෙරට අතර පවතින මිත්‍රත්වය සහ සහයෝගිතාව තුළින් පාර්ශ්වීයමය, ජාතිකමය හා ජනසමාජමය එසේ ම, ශ්‍රී ලංකාව අරමුණු කොටගත් සම්මුතියක් නිර්මාණය වී තිබීම සම්බන්ධයෙන් මා ඉමහත් සතුටට පත් වෙනවා. චීන = ශ්‍රී ලංකා සම්බන්ධතා තව දුරටත් ශක්තිමත් වීම සඳහා මෙම මිත්‍රත්වය සහ සහයෝගිතාව ''අපේක්ෂා ආලෝක ධාරාවක්''වනු ඇත.

**ආදරය සහ උපකාරය අප ගේ දරුවන් සඳහා ''අපේක්ෂා ආලෝක ධාරාවක්'' වනු ඇති බව තුන් වනුව ප්‍රකාශ කළ යුතුයි.**

අන්‍යොන්‍ය ගෞරවය සහ උපකාරය පිළිබඳ අප ගේ සම්ප්‍රදාය අප දෙරටෙහි ජනතා හදවත්වල මුල් බැසගෙන තිබෙනවා. එය ''මිනිසත් බවෙහි අනාගතය වෙනුවෙන් එක්සත් වූ ජනසමාජයක් ගොඩනගමු'' යන ජනාධිපති ක්සී ජින්පිං ගේ මහා වැඩපිළිවෙළෙහි එක් මූලික ප්‍රතිපත්තියක්.

ඒ අවාසනාවන්ත සිද්ධිය වූ අප්‍රේල් 21 වැනිදා මගේ පවුලේ අයත් සමග මා සිටියේ චීනයේ නිවාඩුවක් ගත කරමින්. ඒ පුවත ඇසුණු විගස ම මා පවුලේ අයත් සමග ම මුලින් ම ලබාගත හැකි ගුවන් යානයෙන් කොළඹට පැමිණියා. වගකීම හා ආදරය පිළිබඳ හැඟීම හේතු කොටගෙන ත්‍රස්තවාදය හා මරණය පිළිබඳ බිය මට බාධාවක් වූයේ නැහැ. ඒ අවස්ථාවෙහි මට සිහි වූයේ තානාපති කාර්යාලයටත් ශ්‍රී ලංකා වැසියනටත් මෙරට ක්‍රියාත්මක චීන සමාගම්වලටත් ශ්‍රී ලංකා රජයට මෙන් ම එහි අහිංසක ජනතාවටත් එම අවස්ථාවෙහි මා අවශ්‍ය වන බව පමණයි.

පසුගිය හය මස තුළ දී ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් වුණු හදිසි අවශ්‍යතාවන් පිළිබඳ සෑම ඉල්ලීම්මක දී ම චීනය ඉතා කඩිනම් ලෙසත් කාර්යක්ෂම ලෙසත් ඉහළ ම සහයෝගය ලබා දී තිබෙනවා. ''චීන වේගය'' සහ ''චීන අධිෂ්ඨානය'' යනුවෙන් එය හඳුන්වනු ලබනවා. එම සිද්ධියෙන් සතියක් ඇතුළත දී චීන රතු කුරුස සංගමය මුදලින් මිලියන 18 ක ආධාර ලබා දුන්නා. සති දෙකක් ඇතුළත දී පොලිස් ජීප් රථ 10 ක් චීනය ප්‍රදානය කළා. ශ්‍රී ලංකා පොලිසියත් රජයත් පාර්ලිමේන්තුවත් සඳහා බිලියන 2 ක් පමණ වටිනා හදිසි ආරක්ෂක මෙවලම් ලබා දීමට පසුගිය මාසය වන තෙක් ම චීනය කටයුතු කර තිබෙනවා. ඊට අමතරව, ශ්‍රී ලංකා නාවුක හමුදාව වෙත ආරක්ෂක නෞකාවක් ද ලබා දෙමින් නිලධාරීන් ගණනාවක් පුහුණුව සඳහා චීනයට ගෙන්වාගැනීමටත් පියවර ගෙන තිබෙනවා.

අද මෙරට සුන්දර දරුවන් දකින විට මා තුළ මහත් සොම්නසක් මෙන් ම කණගාටුවක් ද ඇති වෙනවා. ඔවුන් විඳින වේදනාව දරුවන් දෙදෙනෙකු ගේ වැඩිහිටියන් වන මටත් ම ගේ බිරිඳටත් හොඳින් ම දැනෙනවා. මෙම ප්‍රහාරයෙන් පසු තානාපති කාර්යාල නිලධාරීන් සියලු දෙනා ම සමග අප මීගමුවේ ශාන්ත සෙබස්තියන් දෙව්මැඳුරට ගියා. ඒ වගේ ම තුවාල ලැබූ දරුවන් සහ ඔවුන් ගේ පවුල් වෙත ගොස් අවශ්‍යතාවන් පිළිබඳව අප සොයා බැලුවා. අද රාත්‍රියේ දී චීන තානාපති කාර්යාලය වෙනුවෙන් මෙම අසරණයන් වෙත රුපියල් මිලියන 10 ක මුදලක් පරිත්‍යාග කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ශ්‍රී ලංකා රජය විසින් සැලසුම් කොට තිබෙන අනාථ භාර අරමුදල වෙනුවෙන් සිය සමාජ වගකීම් ඉටු කිරීමට චීන සමාගම් සහ ජනසමාජයන් ද බලාපොරොත්තු වෙනවා. අප අවංකව විශ්වාස කරනවා හිරිහැරදායක තත්ත්වයෙන් මිදීමට මෙම දරුවනට හැකි වන බව. මා විශ්වාස කරනවා අප ගේ ආදරය සහ උපකාරය තුළින් මේ දරුවන් ගේ අනාගතය ආලෝකමත් වන බව. ඔවුන් ගේ ''අපේක්ෂාවේ ආලෝක ධාරාව''එයයි. අවස්ථාව යහපත් එකක් වුවත් නැතත් බිලියන 1. 4 ක් වූ  චීන ජනතාව ශ්‍රී ලංකා ජනතාව සමග හැම විට ම ශක්තිමත්ව නැගී සිටින බව මා කිව යුතුයි.

**මහත්ම මහත්මීනි,**

අවසාන වශයෙන් ගරු නීතිපති ලිවේරා මැතිඳුන් ඇතුළු කාර්ය මණ්ඩලයට ඔවුන් ඉටු කරන අතිශයින් ම කාරුණික වූත් එසේ ම දුෂ්කර වූත් කාර්භාරය වෙනුවෙන් විශේෂයෙන් ම මගේ ස්තුතිය ස්තුතිය හිමි විය යුතුයි.

අද රාත්‍රියෙහි පැවැත්වෙන සංගීත උළෙල සාර්ථක වේවා' යි මා ප්‍රාර්තනය කරනවා.
ශ්‍රී ලංකාව සහ එහි ජනතාව වෙත සාමය හා සෞභාග්‍යය උදා වේවා !

චීන = ශ්‍රී ලංකා මිත්‍රත්වය දිගු කල් පවතීවා !